රකථන
தொலைபேசி
elephones
011-2136600
011-2136650
011-2136700

ලේකම්
செயலாளர்
ecretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
ax
011-2876169
011- 2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
- mail
info @psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
/ebsite
www.psc.gov.lk

මගේ අංකය
எனது இல.
My No.
PSC/APL/1/AT/2022

ඔබේ අංකය
உமது இல.
Your No.
COM/TRANS/V/
වා.ස්.මා/2023

දිනය
திகதி
Date
2022.12. 23

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

**2023 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම**

**ඒකාබද්ධ සේවයේ නිලධාරීන්**

ඉහත සඳහන් සේවාවන්හි නිලධරයන් සම්බන්ධයෙන් ඔබ විසින් අනුමත කරන ලද 2023 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනාවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ මේ සමඟ ඔබ වෙත එවමි.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති මෙම අභියාචනා අතරින් ක්‍රියාත්මක විය යුතු දිනය සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් කර නොමැති සියළු ස්ථානමාරු 2023.01.02 දින සිට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඔබ වෙත කාරුණිකව දන්වා සිටිමි. ඒ අනුව, ඉහත සඳහන් සේවාවල 2023 වර්ෂයේ වාර්ෂික ස්ථානමාරුවීම් ක්‍රියාත්මක කරන ලෙසත්, වාර්ෂික ස්ථානමාරුවීම් ලද නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් මෙයින් දන්වමි. ස්ථානමාරු ක්‍රියාත්මකවීම සඳහා වෙනත් නිශ්චිත දිනයක් ලබා දී ඇති ස්ථානමාරුවීම් ද එම දින සිට අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක විය යුතු වේ.

03. එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දන්වා එවීමට කටයුතු කරනු නොලැබේ. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන අතර මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2 (ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

04. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බවද කාරුණිකව දැනුම් දෙමි.

05. 2023 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා සිටින සියලුම නිලධාරීන් නියමිත දිනයේ නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන වර්තමාන සේවා ස්ථානවලින් මුදා හැරීමට කටයුතු කිරීම සියලුම අමාත්‍යාංශ ලේකම් වරුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ හා ආයතන ප්‍රධානීන්ගේ වගකීම වන අතර, එය නිවැරදිව සිදු වන්නේද යන්න පිළිබඳව පුළුල් අධ්‍යයනයක් හා පසු විපරමක් සිදු කරන ලෙසද ඔබ වෙත දන්වා සිටිමි.

2/

06. වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කරන ලද නමුත් නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257(v) වගන්තිය අනුව, සිය කැමැත්තෙන් තනතුර අතහැරගියා සේ සලකා තනතුර අතහැර යාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර අදාළ ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු වේ.

07. තවද, 2023 වාර්ෂික ස්ථානමාරු නියෝග ක්‍රියාත්මක කිරීමේදී අමාත්‍යාංශ වෙනස්වීම හේතුවෙන් යම් නිලධරයකු ස්ථානමාරු විය යුතු සේවා ස්ථානය පිළිබඳව ගැටළු සහගත තත්වයක් පවතින අවස්ථාවකදී, අදාල නිලධාරියාගේ අනුප්‍රාප්තිකයා වශයෙන් සලකනු ලබන නිලධරයා සේවයේ යෙදී සිටින ස්ථානය ඔහුගේ/ඇයගේ නව සේවා ස්ථානය විය යුතු බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

08. එසේම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති ස්ථාන මාරු සම්බන්ධව ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හෝ නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත සලකා නොබලන බව දන්වන අතර එවැනි ඉල්ලීම් හා නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

එම්.ඒ.බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව